රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 150
<u>විශ්‍රාම වැටුප් මාලා අංක: 3.</u>

සියලුම ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානයන් වෙත.,

## විශ්‍රාම වැටුප් ප්‍රදාන ඉක්මන් කිරීම.

විශ්‍රාම වැටුප් ප්‍රදාන ඉක්මන් කරනු පිණිස සවිස්තරාත්මක උපදෙස් ඇතුළත් 1978 ජූනි 14 වැනි දින අංක.121 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය (විශ්‍රාම වැටුප් මාලා අංක.2) කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

02. මෙම චක්‍ර ලේඛයෙහි සඳහන් උපදෙස් අපේක්ෂිත අන්දමින් නොපිළිපදින බවත් ඒ හේතු කොට ගෙන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් ප්‍රදානයන් සකසා අවසන් කිරීමේ කටයුතු ප්‍රමාද වන බවත් මට දැනගන්නට ලැබී තිබේ.

03. එහෙයින් පූර්වෝක්ත චක්‍ර ලේඛයේ සඳහන් උපදෙස් ක්‍රියාත්මක කිරීමට වහාම පියවර ගන්නේ නම් ඉතා අගය කොට සලකමි. මින් ඉදිරියට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ, ඒ ඒ අමාත්‍යාංශවලින්, එම අමාත්‍යාංශ යටතේ ඇති දෙපාර්තමේන්තුවලින් සියලුම විශ්‍රාම වැටුප් කටයුතු හා පාලනය සඳහා පත් කරනු ලැබ සිටින ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන් දෙමසකට වරක් බැගින් හමු වී මේ කටයුතු සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වනු ඇත.

Siriwardhana
බී.බී.අයි.පී.එච්.සිරිවර්ධන.
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ
අමාත්‍යාංශය.

1979 නොවැම්බර් මස 02 වැනි දින,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

තජ්/31.